# ශුද්ධ බයිබලය

## පොදු නව අනුවාදය

CROWTHER HALL
000101

000101

ශ්‍රී ලංකා බයිබල් සමාගම

හා

ශ්‍රී ලංකා කතෝලික රාජගුරු මණ්ඩලය

විසින්

අනුමත කරන ලදී

1982

# SINHALA BIBLE

*A common new translation*

*Approved by*
**The Bible Society**
*and*
**The Catholic Bishops' Conference in Sri Lanka**

Copyright Reserved

**නව ගිවිසුම**

1973- 5,000
1975- 3,000
1977- 5,000
1981- 3,000

**පුරාණ ගිවිසුම**

1982

101050

C B S- 15,000 -1982

ශ්‍රී ලංකා බයිබල් සමාගම වෙනුවෙන් 386. බත්තරමුල්ලේ "සියෝල්" අධ්‍යාපනික හා තාක්‍ෂණික ආයතනයේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

# පටුන

## පුරාණ ගිවිසුම


| | පිට | | පිට |
|---|---|---|---|
| උත්පත්ති | 1 | හිතෝපදේශ | 849 |
| නික්මයාම | 72 | ධර්මදේශකයා | 889 |
| ලෙවී ව්‍යවස්ථාව | 130 | ප්‍රේම ගී | 900 |
| ගණන් කථාව | 172 | යෙසායා | 909 |
| ද්විතීය නීති සංග්‍රහය | 230 | ජෙරමියා | 1006 |
| ජෝසුවා | 282 | විලාප ගී | 1090 |
| වීරා වලිය | 316 | එසකියෙල් | 1100 |
| රූත්ගේ කථාව | 351 | දනියෙල් | 1170 |
| 1 සාමුවෙල් | 356 | හොසියා | 1191 |
| 2 සාමුවෙල් | 403 | ජෝ වෙල් | 1203 |
| 1 රාජාවලිය | 442 | ආමොස් | 1209 |
| 2 රාජාවලිය | 487 | ජෝනා | 1221 |
| 1 වංශාවලිය | 529 | මීකා | 1225 |
| 2 වංශාවලිය | 571 | නාහුම් | 1233 |
| එස්රා | 619 | හබක්කුක් | 1236 |
| නෙහෙමියා | 634 | ශෙපනියා | 1240 |
| එස්තර් | 654 | හග්ගයි | 1244 |
| ජොබ් | 665 | සෙකරියා | 1247 |
| ගීතාවලිය | 716 | මිලාකි | 1260 |

# නව ගිවිසුම


| | | | පිට |
|---|---|---|---|
| පෙර වදන | | | 1 |
| සුබ අස්න | | | |
| ශු. මතෙව් විසින් | | .. | 1 |
| ශු. මාක් | ,, | .. .. | 53 |
| ශු. ලූක් | ,, | .. .. | 87 |
| ශු. ජොහන් | ,, | .. . | 142 |
| ප්‍රේරිතයන්ගේ ක්‍රියා පොත | | | 186 |
| පාවුලු තුමා යැවූ හසුන් | | | |
| රෝමවරුන් | වෙත | | 236 |
| කොරින්තිවරුන් | ,, | (1) | 260 |
| කොරිනතිවරුන් | ,, | (2) | 283 |
| ගලාතිවරුන් | ,, | | 297 |
| එපීසවරුන් | ,, | | 305 |
| පිලිප්පිවරුන් | ,, | | 313 |
| කොලොස්සිවරුන් | ,, | | 319 |
| තෙසලෝනිකවරුන් | ,, | (1) | 325 |
| තෙසලෝනිකවරුන් | ,, | (2) | 330 |
| තිමෝතියස් | ,, | (1) | 333 |
| තිමෝතියස් | ,, | (2) | 339 |
| තීතස් | ,, | | 344 |
| පිලෙමොන් | ,, | | 347 |
| සාමාන්‍ය හසුන් | | | |
| හෙබ්‍රෙව්වරුන් වෙත යැවූ හසුන | | | 349 |
| ජාකොබ් තුමා යැවූ හසුන | | | 366 |
| පේදුරු තුමා | ,, ,, | (1) | 372 |
| පේදුරු තුමා | ,, ,, | (2) | 379 |
| ජොහන් තුමා | ,, ,, | (1) | 383 |
| ජොහන් තුමා | ,, ,, | (2) | 390 |
| ජොහන් තුමා | ,, ,, | (3) | 391 |
| ජූද් තුමා | ,, ,, | | 392 |
| ජොහන් තුමාට එළිදරව් වූ දර්ශන | | | 394 |
| ගැටපද විවරණය | — — | — | 418 |
| කිරුම් මිණුම් හා මුදල් | — — | — | 432 |
| සිතියම් | | | |
| 1. "උත්පත්ති" සමයේ ලෝකය | — | — | 434 |
| 2. "නික්මයාම" ගමන් මඟ | — — | — | 435 |
| 3. මකබ්වරුන්ගේ කාලයේ පලස්තීනය | — | — | 436 |
| 4. කානන් දේශය බෙදී යෑම | — | — | 437 |
| 5. ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනය | | — | 438 |
| 6. ශු: පාවුලු තුමාගේ පළමුවෙනි ගමන | | — | 439 |
| 7. ශු: පාවුලු තුමාගේ දෙවෙනි හා තුන්වෙනි ගමන් | | — | 440 |
| 8. ශු: පාවුලු තුමා රෝමයට ගිය ගමන | — | — | 441 |


# හැඳින්වීම

බයිබලය වූකලී ලොව පුරා පැතිර සිටින කිතුනුවන්ගේ සද ගෞරවාදරයට පාත්‍රවූ ඉමහත් පූජනීය ග්‍රන්ථය වේ. එය අවුරුදු එක්දහස් දෙසීයයක් පමණ කාලයක් තුළ කර්තෘවරුන් හැට දෙනෙකුන් පමණ විසින් ලියන ලද්දකි. එහෙත් එහි වටිනාකම කාල පරිච්ඡෙදයකට සීමා කළ නොහැකි ය. එහි ගැබ්වී ඇත්තේ සර්වකාලීන වටිනාකමකි. බයිබලය අද භාෂා 261 වත් එහි කොටස් භාෂා 1316 වත් පරිවර්තනය කර තිබෙන්නේ එබැවිනි.

බයිබලය එක පොතක් වශයෙන් සලකන නමුත් ඇත්ත වශයෙන් එය පොත් සංග්‍රහයකි. ඉතිහාසය, නීති සංග්‍රහ, පුද පූජා, වත් පිළිවෙත්, පඬි වදන්, ධම්ම පද, කෙටි කතා, ප්‍රෙම කතා, ප්‍රස්තාවපිරුළු, දිවැසිවරුන්ගේ භාෂිත ආදී විවිධ රසවත් සාහිත්‍යාංග එහි ඇතුළත් ය. මෙවැනි විවිධ අංශ ඇතත්, බයිබලය එක පොතක් වශයෙන් සැලකිය හැක්කේ එහි එක තේමාවක් ඇති බැවිනි. 'ජරාවට හා මරණයට හා භාජනය වූ මිනිසාට විමුක්තිය ලබාගත හැක්කේ කෙසේද?' යනු එහි තේමාව ය.

මේ ප්‍රශ්නයට බයිබලය දී ඇති පිළිතුර නම්, අජරාමර දෙවියන් වහන්සේට සම්බන්ධවීමෙන් ජරාවට මරණයට භාජනය වූ මිනිසාගේ විමුක්තිය සැලසෙන බව යි. මේ දේව සබඳතාවට බයිබලයේ ව්‍යවහාර වන වචනය ගිවිසුම යනුයි. ජරාවට හා මරණයට හා භාජනය වී සිටින මිනිසාට අනිත්‍ය භාවය ඉක්ම වූ සදතන ජීවිතය, අනාදී නිත්‍ය, අමරණීය දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධකම ට හෙවත් ගිවිසුමකට ඇතුළත් වීමෙන් ලබාගත හැකි බව බයිබලයේ උගන්වන මූලික සත්‍යය ය. මිනිසාගේ විමුක්තිය සැලසෙන්නේ ඒ ගිවිසුමට හෙවත් දේව සබඳතාවට ඇතුළත් වීමෙන් ය. බයිබලයේ මූලික අදහස වූකලී, මේ විමුක්ති මාර්ගය මිනිසාට පහදා දී, දෙවියන් වහන්සේ සමඟ ගිවිසුමට ඇතුළත් වී එය පැවැත්විය යුත්තේ කෙසේ ද කියා ඔහුට පෙන්වා දීම යි.

මේ මහා ග්‍රන්ථය පුරාණ ගිවිසුම සහ නව ගිවිසුම යනුවෙන් කොටස් දෙකකට බෙදා ඇත. පුරාණ ගිවිසුම ක්‍රිස්තු පූර්ව යුගයටත්, නව ගිවිසුම ක්‍රිස්තු වර්ෂයෙන් පටන්ගත් යුගයටත් අයිතිය. එහෙත් මේ කොටස් දෙක අතරේ සම්බන්ධකමක් ඇත. ඓතිහාසික සිදුවීම් මඟින් ද, දිවැසිවරුන් වැනි ශ්‍රෙෂ්ඨ පුද්ගලයන් මඟින් ද දෙවියන් වහන්සේ විවිධාකාරයෙන් ප්‍රකාශ වූ අයුරු පුරාණ ගිවිසුමේ සඳහන් වන අතර, උන්වහන්සේ පූර්ණ වශයෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළින් ප්‍රකාශ වූ අයුරුත්, ඒ හේතුකොටගෙන දෙවියන් වහන්සේත් මිනිසාත් අතර කවර කලෙකවත් නොවූ විරූ නව සම්බන්ධකමක් හෙවත් නව ගිවිසුමක් ඇතිවූ අයුරුත් දෙවැනි කොටස වන නව ගිවිසුමෙන් විස්තර වී ඇත.

පුරාණ ගිවිසුමටත් නව ගිවිසුමටත් ඇතුළත් කෘතීන් 66, සකල කිතු බැතිමතුන් පිළිගත් සම්මත ග්‍රන්ථ වශයෙන් සලකනු ලැබේ. බයිබලය වශයෙන් සාමාන්‍යයෙන් හඳුන්වන්නේ මේ කොටස් දෙක ඒකාබද්ධ කොටගත් පොත ය. මීට පිටින්, විශේෂයෙන් රෝමානු කතෝලික සභාවට වැදගත් වන "ද්විතීය සම්මත ග්‍රන්ථ" (ඩියුටරෝ–කානෝනිකා) නමින් හැඳින්වෙන, පුරාණ ගිවිසුමේ කාල පරිච්ඡෙදයේ අවසානයත් නව ගිවිසුමේ කාල සීමාවේ පටන්ගැන්මත් අතරේ අවුරුදු 300 ක පමණ කාලයක් තුළ ලියන ලද, ජුදෙව් ඉතිහාසයේ ආගමික හා දේශපාලන ඉතිහාසයේ